ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය - **2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙසමා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වනබැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූලා ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූලා ප්‍රකාශනවලසමස්තඉදිරිපත්කිරීමඅගයනලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පාලක ආයතනය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 හි 09 ඡේදය අනුව මුදල් හා මුදල් සමාන දෑ යටතේ දැක්විය යුතු මාස 03 කින් කල් පිරෙන රු.20,000,000 ක ස්ථාවර තැන්පතු ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | කෙටි කාලීන තැන්පතු මුදල ජංගම වත්කම්වලට ගෙන ඒම නිවැරදි නොවන බව පිළිගන්නා අතර එම අගය මුදල් හා මුදල් සමාන දෑ යටතට මාරු කර අදාළ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරමි. | ප්‍රමිති අංක 02 හි උපදෙස්වලට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුයි. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 14 ඡේදය ප්‍රකාරව ආශ්‍රිත අනාගත ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවයන් අස්ථිත්වය වෙත ගලා ඒමේ භව්‍යතාවයක් සහිත වත්කම් ස්ථාවර වත්කම් වශයෙන් හඳුනාගත යුතු වුවද, 2015 ඔක්තෝබර් 20 දින රු.1,387,500 කට තක්සේරු කරන ලද ආයතනයට අයත් නුවරඑළිය දිස්ත්‍රික්කයේ බගවන්තලාව පිහිටි හෙක්ටයාර 0.468 ක් වූ පුහුණු මධ්‍යස්ථාන ඉඩමේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. තවද, 2020 නොවැම්බර් 03 දින සිට මෙම පුහුණු මධ්‍යස්ථානය කොවිඩ් 19 ප්‍රතිකාර මධ්‍යස්ථානයක් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් තාවකාලිකව ලබා ගෙන තිබීම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරීමක් ද සිදු කර නොතිබුණි. | බොගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ ඉඩම තක්සේරු වටිනාකම වන රු. 1,387,500 ක් ගිණුම්වල ඇතුළත් කර සිදු වී ඇති අඩුපාඩුව නිවැරදි කිරීමට කටයුතු කරන්නෙමු.<br>මෙම මධ්‍යස්ථානය, ආයතනයට නැවත භාරදෙන පදනමින් කෝවිඩ් නිරෝධායන මධ්‍යස්ථානයක් සඳහා ලබා ගෙන තිබීම **පිළිබඳව** 2021 ගිණුම් ප්‍රකාශන තුළින් හෙළිදරව් කිරීමට කටයුතු කරන්නෙමි. | ප්‍රමිති අංක 07 හි උපදෙස්වලට අනුකූලව ස්ථාවර වත්කම් හා ඒවායේ පැවැත්ම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුයි. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසානයේදී ඇනවුම් කළ කාර්යයන් සහ පුස්තකාල පොත් මිලදී ගැනීම සඳහා චෙක්පත් 08 ක් ලියා එයින් රු.2,156,200 ක් කෙරීගෙන යන වැඩ ගිණුමට හා රු.828,669 ක් පුස්තකාල පොත් ගිණුමට හර කර භාණ්ඩ හා සේවා ලැබෙන තෙක් ළඟ තබාගෙන තිබුණි. මෙම හේතුවෙන් කෙරීගෙන යන වැඩ ගිණුම හා පුස්තකාල පොත් ගිණුමේ ශේෂයන් එම වටිනාකම්වලින් වැඩියෙන් ද, මුදල් පොතේ ශේෂය රු.2,984,869 ක් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | භාණ්ඩාගාර ප්‍රතිපාදන නිශ්චිතව ආයතනයට ලැබීමට පෙර වෙනත් ආයතන සමඟ බැඳීම් ඇති කර ගැනීම ආයතනය මූල්‍ය අපහසුතාවන්ට පත් විය හැකි කරුණක් බැවින්, ප්‍රාග්ධන වියදම් සඳහා 2020.12.03 **දින හා 2**020.12.30 දින ලැබී තිබූ ප්‍රතිපාදන මත ඇණවුම් නිකුත් කර ඇත. | භාණ්ඩ හා සේවා ලබා ගැනීමට පෙර චෙක්පත් නොලිවිය යුතුයි. |

| | | |
|---|---|---|
| (ආ) ආයතනය පවත්වාගෙන යන අතුරුගිරියේ පිහිටි ඉඩමෙන් හෙක්ටයාර් 1.9499 ක බිම් කොටසක් 2014 ඔක්තෝම්බර් 15 දිනැති අංක 1884/23 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් යුධ හමුදාවට පවරා ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු වන්දි මුදල වූ රු.152,585,000 ක් 2018 ඔක්තෝම්බර් 11 දින ලබාදී තිබුණද, වන්දි ගෙවීම ප්‍රමාද වීම නිසා ලැබිය යුතුව තිබුණු රු.42,594,530 ක ප්‍රමාද පොලිය ගිණුම්ගත කර නොතිබුණි. මෙම නිසා එම වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය අඩුවෙන් දැක්වුණි. | මෙම පොලී මුදල ලැබීම පිළිබඳ පැවති අවිනිශ්චිත තත්ත්වය හේතුවෙන් ලැබිය යුතු පොලිය ලෙස ගිණුම්කරණ සටහනක් ඇතුළත් නොකළ අතර, 2021.01.18 දින ලැබුණු පොලී මුදල 2021 වසරේ පොලී ආදායමක් ලෙස ගිණුම්ගත කර සිදු වී ඇති අඩුපාඩුව නිවැරදි කිරීමට පියවර ගන්නෙමු. | පොලී මුදල් නිවැරදිව ගිණුම්වලට ගැලපිය යුතුයි. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| මධ්‍යම ඉංජිනේරු උපදේශන සේවා පෞද්ගලික සමාගමට ගෙවිය යුතු මුදල | 16,994,328 | 17,831,535 (ශේෂ සනාතන ලිපිය) | 837,207 | කොන්ත්‍රාත්කරු රු.17,831,525 ක් සනාථ කළද, ගෙවීම් සඳහා බැදී සිටින මුදල රු.16,994,328 ක් පමණි. රඳවා ගැනීමේ මුදල් රු.9,794,504.25 ක් සඳහා වැට් ඉන්වොයිසියක් ඉදිරිපත් කර නොතිබීම මත වැට් අගයන් ගණනය කර නොමැත. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් ලේඛන හා උප ලේඛන සමඟ නිවැරදිව සැසදිය යුතු අතර ගෙවිය යුතු බදු වගකීම නිවැරදිව හඳුනාගෙන ගිණුම්වලට ගැලපීමට කටයුතු කළ යුතුයි. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 ජනවාරි 01 දින සිට ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ එකතු කළ අගය මත බදු ලියාපදිංචිය පිරිවැටුම ප්‍රමාණවත් නොවීම මත දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අක්‍රිය කර තිබූ නමුත් 2019 වර්ෂය දක්වා කාලයට අදාළව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු.19,820,121 ක හිලව් බද්දක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර එය අයකරගත | 2020.01.01 දිනට ප්‍රථම දේශීය මිලට ගැනුම් මත බදු බැර වශයෙන් ඉහත අතිරික්ත ශේෂය පෙන්නුම් කර ඇත. 2020.01.01 දින සිට වැට් ලියාපදිංචිය අහෝසි කිරීම මත ආයතනය විසින් බාහිර පාර්ශ්වයන්ට සිදු කරන සේවා සඳහා වැට් ඉන්වොයිස් නිකුත් නොකරන බැවින්, ඉදිරියේ දි වැට් හිලව් කිරීමේ හැකියාවක් නොමැත. මේ පිළිබඳව | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| හැකි ශේෂයක් නොවන බවට නිරීක්ෂණය විය. එහි නිවැරදිතාවය ද සනාථ කරගෙන නොතිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලිපියක් මගින් දැනුම් දීමට කටයුතු කරුනු ලැබේ. | |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.96,815,868 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.105,809,643 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,993,775 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රතිපාදනය රු.28,595,793 කින් ඉහළ ගොස් වියදම රු.25,294,503 කින් පහළ ගොස් තිබුණ ද, ආයතනය ඉපැයූ ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව රු.62,884,073 කින් හෙවත් සියයට 58 කින් පහළ යාම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවනතා විශ්ලේෂණය

2019 වර්ෂයේ රු.135,782,603 ක් වූ රජයේ ප්‍රාග්ධන හා අයභාර ප්‍රදානයන් 2020 වර්ෂයේදී රු.164,378,397 ක් දක්වා රු.28,595,794 කින් හෙවත් සියයට 21 කින් ඉහළ ගොස් තිබුණ ද, පෙර වර්ෂයේ දී රු.108,847,282 ක් වූ ආයතනයේ ඉපැයුම් ආදායම රු.45,963,210 ක් දක්වා රු.62,884,072 කින් හෙවත් සියයට 58 කින් පහළ ගොස් තිබීමෙන් පෙර වර්ෂයේ රු.244,629,886 ක් වූ මුළු ආදායම සමාලෝචිත වර්ෂයේදී රු.210,341,606 ක් දක්වා රු.34,288,280 කින් හෙවත් සියයට 14 කින් පහළ ගොස් තිබුණි. ආයතනය විසින් පවත්වනු ලබන කෘෂිකාර්මික කටයුතු සම්බන්ධ පාඨමාලාවන් COVID -19 වසංගත තත්ත්වය හමුවේ සුදුසු ආකාරයට පවත්වාගෙන යාම කෙරෙහි අවධානය යොමු නොකිරීම මේ කෙරෙහි බලපා තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1979 අංක 45 දරන ජාතික වැවිලි කළමනාකරණ ආයතන පනතේ 2 (ඊ) වගන්තිය යටතේ ආයතනයේ අරමුණු ලෙස දැක්වෙන "වෙනත් සමාන ආයතනවලින් දැනටමත් විධිවිධාන සලස්වා නොමැති වැවිලි කළමනාකරණය සහ කම්කරු සම්බන්ධතා යන ක්ෂේත්‍රයන්හි පර්යේෂණ පැවැත්වීම, 4(ඇ) වගන්තිය යටතේ ආයතනයේ බලතල යටතේ දැක්වෙන "වැවිලි සංවර්ධනයේ සියලු අංශ පිළිබඳව පර්යේෂණ පැවැත්වීම" ආයතනයේ දැක්ම යටතට එන "වැවිලි කළමනාකරණය පිළිබඳ පර්යේෂණ පැවැත්වීමේ විශිෂ්ඨ ආයතනය බවට පත්වීම" යන කාරණා සාක්ෂාත් කර ගැනීම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමුකර ඇති බවට නිරීක්ෂණය නොවීය. | ආයතනය විසින් 2018 වසරේ දී වැවිලි ක්ෂේත්‍රයේ සිදු කරන ලද පර්යේෂණයන් එළි දැක්වීම, දිරි ගැන්වීම හා ආධාර කිරීම වශයෙන් පර්යේෂණ සම්මේලනයක් පැවැත්වූ අතර, 2020 වසරේ සම්මේලනය 2021.02.12 වන දින පවත්වන ලදී.<br>ආයතනයේ අධ්‍යක්ෂ පරිසර අධිකාරිය හා සම්බන්ධ වී කටුපොල් වගාව රටට සුදුසු ද යන්න පිළිබඳව සිදු කරන ලද පර්යේෂණයේ, පර්යේෂණ මණ්ඩලයේ සහභාගිත්වය දරන ලදී.<br>ආයතනයේ ඩිප්ලෝමා පාඨමාලාවල "පර්යේෂණ ක්‍රමවේද" මොඩියුලය යටතේ සෑම සිසුවෙකුම පර්යේෂණයක් හෝ සමීක්ෂණයක් සිදු කොට වාර්තාවක් සකසනු ලැබේ. | පනතේ විධිවිධාන ප්‍රකාරව ආයතනය පිහිටුවීමේ අරමුණු නිසි පරිදි ඉටු කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුයි. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රබර්, තේ, පොල් සහ අනෙකුත් බෝග සම්බන්ධයෙන් 2018 වර්ෂයේදී ශිෂ්‍යයන් 12,855 කගේ සහභාගීත්වයෙන් ශක්‍යතා සංවර්ධන වැඩසටහන් 232 ක් පවත්වා තිබුණද, 2019 සහ 2020 වර්ෂයන්හි සැලකිය යුතු අඩුවීමක් නිරීක්ෂණය කරමින් පිළිවෙලින් ශිෂ්‍යයන් 5,414 ක හා 693 කගේ සහභාගීත්වයෙන් පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව 106 ක් හා 12 ක් වූයෙන් එහි ප්‍රතිශතය සියයට 45.6 ක් හා සියයට 5.1 ක් පමණක් විය. | 2019 වර්ෂයේදී බෝම්බ පිපිරීමේ සිද්ධිය හා 2020 වර්ෂයේ දී Covid-19 වසංගත තත්ත්වය හේතු කොටගෙන ප්‍රාදේශීය මට්ටමෙන් වැඩසටහන් පැවැත්වීමට තිබූ හැකියාව ඉතාමත් සීමාසහිත විය. වැඩසටහන්වලට සහභාගී වූවන්ගේ සංඛ්‍යාව ද අඩු විය. | COVID වසංගත තත්ත්වය හමුවේ සුදුසු ආකාරයට ශක්‍යතා සංවර්ධන වැඩසටහන් පවත්වාගෙන යාම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| (ආ) ආයතනය විසින් පවත්වන ලද වැවිලි කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව, වැවිලි කළමනාකරණය සහ පොත් තැබීමේ සහතික පත්‍ර පාඨමාලාව, ඇතුලු පාඨමාලා 06 ක අවසන් වූ ආසන්න පාඨමාලා 02 ක් සඳහා ලියාපදිංචි වූ සිසුන් 259 ක් වූ අතර එයින් සිසුන් 103 දෙනෙකු හෙවත් සියයට 40 ක් පාඨමාලාව හැරගොස් තිබුණි. එසේ වුවද, ඊට හේතු වූ කරුණු පිළිබඳව සොයාබලා එම පාඨමාලාවන්හි ගුණාත්මකභාවය වැඩිදියුණු කර ඵලදායීතාවය නන්වා ගැනීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි. | වැවිලි කළමනාකරණ පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හැරගිය පසුගිය අධ්‍යයන වසර 5 ක සිසුන් වර්තමාන පාඨමාලාවලට සම්බන්ධ කිරීමට ඉඩ ප්‍රස්ථා සකසා දෙන ලදී. වැවිලි කළමනාකරණය සහ පොත් තැබීමේ සහතික පත්‍ර පාඨමාලාවට සහභාගී වූවන් එක් මොඩියුලයකට පමණක් සහභාගී නොවූ අය වේ. තේ කම්හල් සහායක සහ තේ ක්ෂේත්‍ර සහායක පාඨමාලාවන්හි සිසුන් 06 මසක රැකියා පුහුණුව සම්පූර්ණ කර නොමැති අතර මානව සම්පත් කළමනාකරණ පදනම් පාඨමාලාව සහ සහතික පත්‍ර පාඨමාලාව නොයෙකුත් රාජකාරිමය දුෂ්කරතාවන් මත පාඨමාලා හැර ගොස් ඇත. | පාඨමාලාවන් සාර්ථක ලෙස අවසන් කිරීමට නොහැකි වන කරුණු හඳුනාගෙන ඒ සඳහා නිසි පිළියම් යෙදිය යුතුය. |
| (ඇ) ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේදී සිසුන් 157 දෙනෙකුගේ සහභාගීත්වයෙන් ශාස්ත්‍රීය සහ වෘත්තීමය පුහුණු වැඩසටහන් 08 ක් පවත්වන්නට සැලසුම් කර සිසුන් 47 දෙනෙකුගේ සහභාගීත්වයෙන් වැඩසටහන් 02 ක් පමණක් පවත්වා තිබූ අතර පසුගිය වර්ෂ 04 ක තත්ත්වය සලකා බැලීමේදී සිසුන් 760 කගේ සහභාගත්වයෙන් වැඩසටහන් 50 ක් පවත්වන්නට සැලසුම් කර සිසුන් 609 දෙනෙකුගේ සහභාගීත්වයෙන් වැඩසටහන් 38 ක් පවත්වා තිබුණි. තවද, 2019 හා 2020 වර්ෂයන්හිදී 74 දෙනෙකුගේ සහභාගත්වයෙන් කුසලතා සංවර්ධන වැඩසටහන් 5 ක් පවත්වන්නට සැලසුම් කර සිසුන් 38 දෙනෙකුගේ සහභාගීත්වයෙන් | ශාස්ත්‍රීය වැඩසටහන්වලට සහභාගී වන්නන්ගේ යම් අඩුවීමකටත්, ප්‍රායෝගික සැසිවලින් සමන්විත ධාරිතා සංවර්ධන වැඩසටහන් සඳහාත් පාස්කු බෝම්බ පිපිරීමේ සිද්ධිය සහ 2020 වසරේ COVID-19 වසංගතය තත්ත්වය හේතු විය. | COVID වසංගත තත්ත්වය හමුවේ සුදුසු ආකාරයට වැඩසටහන් පවත්වාගෙන යාම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

වැඩසටහන් 3 ක් පමණක් පැවැත්වා තිබුණි. කාලීන අවශ්‍යතාවය මත මෙම පාඨමාලාවන්හි විෂය නිර්දේශය සංශෝධනය කර අවශ්‍ය පහසුකම් වැඩිදියුණු නොකිරීම මෙම තත්ත්වයට හේතු වී ඇති බවට නිරීක්ෂණය විය.

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයතනයේ 71 ක් වූ අනුමත කාර්ය මණ්ඩලයෙන් පුහුණු කිරීමේ විශේෂඥ (වැවිලි කළමනාකරණය), සහකාර අධ්‍යක්ෂ (අලෙවිකරණ, ව්‍යාපාර ප්‍රවර්ධන හා සැලසුම්), පුහුණු නිලධාරී (වැවිලි ඉංජිනේරු) ඇතුළුව තනතුරු 16 ක් පුරප්පාඩුව පැවතීම ආයතනය පිහිටුවීමෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි බලපානු ලබන බවට නිරීක්ෂණය විය. තවද, 2019 හා 2020 වර්ෂයන්හි තනතුරු නාම 06 ක් යටතේ තනතුරු 08 ක් අනුමත කර තිබුණ ද, ඊට අදාළ බඳවාගැනීමේ පටිපාටි අනුමත කර නොගැනීමෙන් බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි වී තිබුණි. | මෙම තනතුරු 7 සඳහා සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටි සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. මේ වන විට නිකුත් කර ඇති චක්‍රලේඛයක් හේතුවෙන් සියලු බඳවා ගැනීම් නවතා ඇත. | බඳවාගැනීමේ පටිපාටි අනුමත කර ගැනීමටත්, රෙගුලාසීන්ට අනුගතව පුරප්පාඩු පුරවා ගැනීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 06 දිනැති අංක පීඊඩී/ 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.51 හා 6.5.3 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන දින 42 ක් ප්‍රමාද කර 2021 අප්‍රේල් 12 දින ලබා දී තිබූ අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | කෝවිඩ් තත්ත්වය තුළ වරින්වර රට වසා තැබීම හා පාලක මණ්ඩල රැස්වීම් පැවැත්වීමේ ගැටළු මතු වීමත්, කිහිපදෙනෙක් කෝවිඩ් රෝගයට ගොදුරු වීම හේතුවෙන් ආයතනය අවස්ථා කිහිපයක දී වරින් වර වසා දැමීමට සිදුවීමත් මත මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් සිදුවිය. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු යුතුය. |

**4.2 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර ප්‍රසිද්ධ කිරීමට කටයුතු කර නොතිබුණි. | 2019 වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. | නියමිත දින වකවානු ඇතුළත වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය. |